# ආරක්ෂක අමාත්‍යාංශය

# ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය (NBRO)

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ (NBRO) හි පවතින පහත සඳහන් පුරප්පාඩු සඳහා ශ්‍රී ලාංකීය පුරවැසියන්ගෙන් අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ.

## අධ්‍යක්ෂ (පරිපාලන) තනතුර – (HM 1-3) තනතුරු 01 යි

**සුදුසුකම්** : විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන පිළිගත් විශ්වවිද්‍යාලයක් වෙතින් කළමනාකරණය, ව්‍යාපාර පරිපාලනය, රාජ්‍ය පරිපාලනය, මානව සම්පත් කළමනාකරණය හෝ අදාළ ක්ෂේත්‍රයක ප්‍රථම උපාධිය විද්‍යාවේදී විශේෂ උපාධියක් ලබා තිබීම.

සහ

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්ව විද්‍යාලයක් වෙතින් කළමනාකරණය, ව්‍යාපාර පරිපාලනය, රාජ්‍ය පරිපාලනය, මානව සම්පත් කළමනාකරණය හෝ අදාළ ක්ෂේත්‍රයක පශ්චාත් උපාධියක් (මාස්ටර්ස්) ලබා තිබීම.

සමඟ

සංස්ථාවක/ ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ආයතනයක හෝ පිළිගත් පුද්ගලික ආයතනයක "කළමනාකාර මට්ටමේ" අවම වශයෙන් වසර 15 ක පළපුරුද්ද

**පොදු කොන්දේසි**

**වැටුප් පරිමාණය** : IM 1-1 සේවා ශ්‍රේණියේ

රු. 86,865-15X2,270-120,915

**වැටුප් පියවර** : රු. 86,865/-

**වයස** : අවුරුදු 35 ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 55 ට වැඩි නොවිය යුතුය.

**ප්‍රතිලාභ** :

- ජීවන වියදම් දීමනාව
- සංවිධානය විසින් සේ.අ.අ. සඳහා 12% ක හා සේවක භාරකාර අරමුදල සඳහා 3% ක දායකත්වයට හිමිකම
- ලබා නොගත් වෛද්‍ය නිවාඩු සඳහා ගෙවීම්, වාර්ෂික ප්‍රසාද දීමනා ලබාදීම හා මාසික කාර්ය සාධන දිරි දීමනා හා කළමනාකරණ මණ්ඩලය විසින් අනුමත කරන අනෙකුත් දීමනා
- දුරකථන දීමනා හා වෛද්‍ය හා ජීවිත රක්ෂණ ආවරණ
- රජයේ ස්ථාවර පරිපාටි ප්‍රකාරව ප්‍රවාහන පහසුකම් තෝරාගනු ලබන අපේක්ෂකයාට හිමිවේ

රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනවල සේවයේ නියුතු සේවකයන්ගේ අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය. සම්පූර්ණ ජීව දත්ත සහිත අයදුම්පත් අදාළ සහතිකවල පිටපත් සමඟ 2024.06.27 වෙනි දින හෝ ඊට පෙර ලැබෙන පරිදි පහත සඳහන් ලිපිනය වෙත ලියාපදිංචි තැපැල් මගින් ඉදිරිපත් කළ යුතුය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

**අධ්‍යක්ෂ ජනරාල්,**

**ජා.ගො.ප.සංවිධානය,**

**99/1, ජාවත්ත පාර, කොළඹ 05.**